# සියපත ෆිනෑන්ස් පීඑල්සී

## **ප්‍රධාන තොරතුරු** ලේඛනය

මෙම ලේඛනයෙහි අන්තගර්ත වන්නේ සියපත ෆිනෑන්ස් පීඑල්සී විසින් පිරිනමනු ලබන පහසුකම්/සේවාවල ප්‍රධාන තොරතුරු වේ. සමාගමේ අභිමතය පරිදි, පහත දක්වා ඇති යම් නියම, කොන්දේසි, අය කිරීම් සහ ගාස්තු සංශෝධනය කිරීම, එකතු කිරීම හෝ ඉවත් කිරීම සඳහා හිමිකම ඇත්තේ සමාගම සතුව ය. ශ්‍රී ලංකා මහ බැංකුවේ 2018 අංක 1 දරන විධානය යටතේ බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සඳහා නිකුත් කරන ලද මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුවේ අවශ්‍යතාවලට අනුකූලව, මෙම ප්‍රධාන තොරතුරු ලේඛනය පාරිභෝගික හවතුන් වෙත නිකුත් කරනු ලැබේ.

### 01. පහසුකම් සහ සේවා

#### I. කල්බදු (ලීසිං)

| | |
|---|---|
| **ලීසිං සේවා ලාංඡන** | |
| **සේවාවන් පිළිබඳ විස්තරය** | ⦿ ක්ෂුද්‍ර කල්බදු සහ සාමාන්‍ය කල්බදු යටතේ, පෞද්ගලික සහ ව්‍යාපාරික කටයුතු සඳහා තනි පුද්ගල, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ආයතනික සේවාදායක හවතුන් වෙනුවෙන් ඔවුන්ගේ අභිරුචියට අනුව සකසන ලද කල්බදු (ලීසිං) පහසුකම්<br><br>⦿ ලියාපදිංචි කළ/නොකළ මෝටර් රථ/ SUV රථ/වෑන් රථ/ වාණිජමය රථවාහන/බස් රථ/ත්‍රිරෝද රථ/තනි කැබ් රථ/සැහැල්ලු ට්‍රක් රථ/ඉඩම් වාහන/මෝටර් බයිසිකල්, තෝරාගත් වගර්වල යන්ත්‍රෝපකරණ සහ කෘෂිකාමරීක උපකරණ ආදිය ඇතුළත් පුළුල් පරාසයක ඇති රථවාහන/උපකරණ සඳහා ලීසිං පහසුකම් පිරිනැමේ. |

| | |
|---|---|
| **සේවාවන්හි ලක්ෂණ, නියම සහ කොන්දේසි** | ⦿ ආපසු ගෙවීමේ හැකියාව සහිත, වයස අවුරුදු 18ට වැඩි, වලංගු ජාතික හැඳුනුම්පතක්/ගමන් බලපත්‍රයක් හිමි, ශ්‍රී ලංකාවේ වෙසෙන පුද්ගලයකු හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වූ ආයතනයක්, ලීසිං පහසුකම් සඳහා ඉල්ලුම් කිරීමට යෝග්‍යතාපූර්ණ වේ.<br><br>⦿ අවම කාල සීමාව එක් වර්ෂයක් සඳහා සීමා කර ඇති අතර, උපරිම කාල සීමාව මාස 72ක් (වසර 6ක්) දක්වා දීර්ඝ කළ හැකිය.<br><br>⦿ කල්බදු පහසුකම් සඳහා වන සුරැකුම, වත්කමේ පරම අයිතිය ලබා ගැනීමයි. අවශ්‍ය නම් ඇපකරුවන් ද සම්බන්ධ කරගත හැකිය.<br><br>⦿ සියපත ෆිනෑන්ස් වෙත මූල්‍යමය පොලිය ලබා දෙමින්, සෑම වසරකම, පහසුකම සපයනු ලබන සම්පූර්ණ කාල පරිච්ඡේදය තුළ පුළුල් රක්ෂණාවරණයක් ලබා ගත හැකි වේ.<br><br>⦿ පහසුකම පිළිබඳව සලකා බලනු ලැබීමට පෙරාතුව, සේවාදායකයා වෙත, පවතින අදාළ පොලී ගාස්තුව දැනුම් දෙනු ලැබේ.<br><br>⦿ ණය පහසුකම්වලට අදාළ වන පොලී අනුපාතය, පහසුකම් වර්ගය, භුක්ති විඳින කාල සීමාව සහ පිරිනමනු ලබන සුරැකුම ආදිය මත රඳා පවතියි. වෙළෙඳපොළ තත්ත්වයන් මත පදනම්ව, පොලී අනුපාත කලින් කලට ප්‍රතිශෝධනය කරනු ලැබේ.<br><br>⦿ සමාගම, නම්‍යශීලී වූ ආපසු ගෙවීමේ විකල්ප ලබා දෙයි: පෙර ගිවිසි ආකාරයට, සමාන වාරික හෝ ව්‍යුහාත්මක ක්‍රමයට ගෙවීම.<br><br>⦿ බදු ගිවිසුමට එළඹීමට පෙර, මාසික වාරිකය සහ වෙනත් අය කිරීම් නිශ්චිතව දක්වනු ලැබේ. අපගේ නිලධාරීන් ලවා කල් ඇතිව සියලු නියම සහ කොන්දේසි පැහැදිලි කරගැනීමේ |

| | |
|---|---|
| | හැකියාව ඔබ සතු වේ.<br><br>• පොලී අනුපාත, අය කිරීම්, ලීසිං පහසුකමේ වටිනාකම, පියවීමේ කාල සීමාව, ඇප අවශ්‍යතා සහ වෙනත් විශේෂ නියම සහ කොන්දේසි, පහසුකම් ස්වභාවය මත පදනම්ව එකිනෙකට වෙනස් විය හැකිය. ගිවිසුමට එළඹීමට පෙර, ණය ගැනුම්කරුට ඉදිරිපත් කරන අපර්ණ ලිපිය මගින්, සියලු නියම සහ කොන්දේසි පිළිබඳව දැනුම්වත් කරනු ලැබේ. |

| | |
|---|---|
| **ලීසිං සේවාව ලබා ගැනීමේ ක්‍රියාපටිපාටිය** | ⦿ ප්‍රථමයෙන්ම, සේවාවෙහි ලක්ෂණ සහ අවශ්‍යතා පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා ණයගැනුම්කරු සමාගමේ නියෝජිතයකු හමුවිය යුතුය.<br><br>⦿ සාකච්ඡාවෙන් අනතුරුව, ණයගැනුම්කරු සහ සමාගම් නියෝජිතයා විසින් සේවාවට අදාළ නියම සහ කොන්දේසි කතිකා කරගනු ලැබේ.<br><br>⦿ ණයගැනුම්කරු, අදාළ අයදුම්පත්‍රය නිසි ලෙස පුරවා අවශ්‍ය ලිපිලේඛන ද සමඟ සමාගම් නියෝජිතයාට එය භාර දිය යුතුය. සම්පූර්ණ අයදුම්පත ලද විට, ගැනුම්කරු විසින් ඉල්ලා සිටිනු ලැබ ඇති පහසුකම/ සේවාවේ වගර්ය මත පදනම්ව සමාගම විසින් එය අදාළ ක්‍රියාවලිය වෙත යොමු කර තක්සේරු කරනු ලැබේ.<br><br>⦿ අනුමැතිය ලබා දෙන ක්‍රියාවලියේ දී, වැඩිදුර තොරතුරු, ලේඛන හෝ ණය විශ්ලේෂණය මත පදනම් වූ තොරතුරු ලබා ගැනීම සඳහා ගනුදෙනුකරු/ඇපකරුවන්ව සම්බන්ධ කරගනු ලැබේ .<br><br>⦿ මුල් අවස්ථාවේ දී කතිකා කරගත් නියම සහ කොන්දේසි, අනුමැතිය ලබා දෙන අවස්ථාවේ දී සංශෝධනයට ලක් විය හැකි අතර, පහසුකම ප්‍රදානය කිරීමට පෙරාතුව ඒ පිළිබඳව සමාගම විසින් අයදුම්කරුව දැනුම්වත් කරනු ලැබේ .<br><br>⦿ සමාගම විසින් පහසුකම අනුමත කරනු ලබන අවස්ථාවේ දී, අවශ්‍ය නෛතික ලේඛන සම්පාදනය කරනු ලැබෙන අතර, ලේඛන නිසි ලෙස සම්පූර්ණ කරනු ලැබීමෙන් අනතුරුව පහසුකම සැපයීම සිදු කෙරේ.<br><br>⦿ පහසුකමක් සඳහා අනුමැතිය ලබා දීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ පරම අභිමතය සමාගම සතු වේ. |

## II. රන් මූල්‍යකරණය

| | |
|---|---|
| රන් ණය සේවාවන්හි ලාංඡන | |
| රන් ණය පිළිබඳ විස්තරය | ⦿ සියපත ෆිනෑන්ස් ආයතනය විසින් තනි පුද්ගලයන් සඳහා මෙන්ම ව්‍යාපාරික ආයතන සඳහා ද රන් භාණ්ඩ උකස් කර ණය පහසුකම ලබා ගත හැකිය .<br><br>⦿ කොටස් වශයෙන් ණය පියවීමේ පහසුව.<br><br>⦿ අවශ්‍යතාව පරිදි කොටස් වශයෙන් රන් භාණ්ඩ බේරා ගැනීමේ හැකියාව.<br><br>⦿ ඔබගේ වටිනා භාණ්ඩ සඳහා ඉහළ ආරක්ෂාවක් සමඟ විශ්වසනීයභාවය සහ 100% ක් නොමිලේ වන රක්ෂණාවරණයක් ඔබට පිරිනැමෙනු ඇත. |
| රන් ණය සේවාවේ ලක්ෂණ, නියම සහ කොන්දේසි | ⦿ ආපසු ගෙවීමේ හැකියාව සහිත, වයස අවුරුදු 18ට වැඩි, වලංගු ජාතික හැඳුනුම්පතක්/ගමන් බලපත්‍රයක් හිමි, ශ්‍රී ලංකාවේ වෙසෙන පුද්ගලයකු හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වූ ආයතනයක්, රන් ණය පහසුකම සඳහා ඉල්ලුම් කිරීමට යෝග්‍යතාපූර්ණ වේ.<br><br>⦿ සේවාව ලබා ගැනීම සඳහා වලංගු ජාතික හැඳුනුම්පතක් (NIC)/ රියදුරු බලපත්‍රයක්, ගමන් බලපත්‍රයක් ලබා දිය යුතුය.<br><br>⦿ අවම ණය අත්තිකාරම් මුදල වන්නේ රු. 1,000/-.<br><br>⦿ ගනුදෙනුකරුගේ තේරීම අනුව, සාමාන්‍ය රන් ණය සඳහා මාස 1-12 දක්වා ද ව්‍යාපාර රන් ණය පහසුකම් සඳහා මාස 1, 3, 6, සහ |

| | |
|---|---|
| | 12 ක් සඳහා පහසු නැවත ගෙවීමේ ක්‍රම ප්‍රදානය කෙරේ .<br><br>• ණය අත්තිකාරම තීරණය කරනු ලබන්නේ උකස් කරනු ලබන රන් භාණ්ඩයේ වටිනාකම සහ වතර්මාන වෙළඳපොළ අගය මත ය .<br><br>• අදාළ පොලී අනුපාතය ගනුදෙනුකරුට දන්වනු ලැබේ.<br><br>• ණය පහසුකම්වලට අදාළ වන පොලී අනුපාත, පහසුකම් වගර්ය, භුක්ති විඳින කාල සීමාව සහ පිරිනමනු ලබන සුරැකුම ආදිය මත රඳා පවතියි. වෙළෙඳපොළ තත්ත්වයන් මත පදනම්ව, පොලී අනුපාත කලින් කලට ප්‍රතිශෝධනය කරනු ලැබේ.<br><br>• ගිවිසි කාල සීමාවේ ඕනෑම අවස්ථාවක දී රන් භාණ්ඩ නිදහස් කරගැනීමේ හෝ ගිවිසුම අලුත් කිරීමේ හැකියාව ගැනුම්කරු සතුය.<br><br>• 1949 අංක 6 දරන උකස් පනත ප්‍රකාරව උකස් තබන ලද භාණ්ඩ සඳහා ණයගැනුම්කරු උකස් ඔප්පුවක් අත්සන් කළ යුතුය.<br><br>• කොන්ත්‍රාත් කාලය තුළ නිදහස් කර නොගන්නා ලද හෝ අලුත් කර නොගන්නා ලද රන් ණය භාණ්ඩ, ගනුදෙනුකරුවා දැනුම්වත් කිරීමෙන් අනතුරුව උකස් පනතේ නියෝග ප්‍රකාරව වෙන්දේසි කරනු ලැබේ.<br><br>• පොලී අනුපාත, අය කිරීම්, පහසුකම් මුදල් ප්‍රමාණ, පියවීමේ කාල සීමාව, ඇප අවශ්‍යතා සහ වෙනත් විශේෂ නියම සහ කොන්දේසි ආදී ප්‍රධාන නියම සහ කොන්දේසි, පහසුකම් වගර්ය මත පදනම්ව එකිනෙකට වෙනස් විය හැකිය. ගිවිසුමට එළඹීමට පෙර, ණය ගැනුම්කරුට ඉදිරිපත් කරන පිරිනැමීමේ ලිපිය මගින්, සියලු නියම සහ කොන්දේසි පිළිබඳව දැනුම්වත් කරනු |

| | |
|---|---|
| | ලැබේ. |
| රන් ණය සේවාව ලබා ගැනීමේ ක්‍රියාපටිපාටිය | ⦿ අදාළ ණය ගැනුම්කරු ශාඛාව වෙත ගොස් රන් ණය පහසුකම අයදුම් කළ යුතුය.<br>⦿ ශාඛාවේ සිටින කායර් මණ්ඩලය, රන් ණය ගනුදෙනු සඳහා යෝග්‍යතාව තක්සේරු කරනු ඇත.<br>⦿ කායර් මණ්ඩලය විසින් රන්/රන් භාණ්ඩ තක්සේරු කර මිල නියම කිරීමෙන් අනතුරුව සමාගමේ තක්සේරු නිණර්යක මත පදනම්ව අදාළ භාණ්ඩ සඳහා ප්‍රදානය කළ හැකි මුදල් ප්‍රමාණය ගනුදෙනුකරු වෙත ප්‍රකාශ කරනු ලැබේ.<br>⦿ එම මුදල් ප්‍රමාණය සමඟ ගනුදෙනුකරු එකඟ වන්නේ නම්, රන් ණය පහසුකම ප්‍රදානය කෙරෙනු ඇත. |

## III. ස්ථාවර තැන්පතු

| | |
|---|---|
| ස්ථාවර තැන්පතු සේවාවන්හි ලාංඡනය | Siyapatha Finance FIXEDEPOSITS The true stability in your life's journey |
| සේවා පිළිබඳ විස්තරය | ⦿ ස්ථාවර තැන්පතු සේවාව මගින් ගනුදෙනුකරුවන්ගේ මුදල් සමාගමෙහි තැන්පත් කිරීමත් ඉල්ලුම් කරන කාල සීමාව සඳහා ඊට අදාළ පොලී ආදායම ආපසු ගෙවනු ලැබීමේ පහසුකමත් පිරිනැමේ. සමාගම සමඟ මුදල් තැන්පත් කෙරෙන අතර, වටිනාකම සුරක්ෂිත වේ.<br>⦿ ඔබ වෙහෙස වී උපයාගත් මුදල් සඳහා ස්ථාවරත්වය, සේවය සහ ප්‍රතිලාභ සහතික කළ සුරක්ෂිත සේවාවක් වන්නේ, එය සම්පත් බැංකු සමූහයේ විශාලතම අනුබද්ධිත මූල්‍ය ආයතනය වන බැවිනි.<br>⦿ ශ්‍රී ලංකා මහ බැංකුවේ උපරිම අනුපාතයන්ට සමගාමී වූ |

| | |
|---|---|
| | ආකෂර්ණීය පොලී අනුපාත සහ කඩිනම් සේවාවක් සමාගම මගින් පිරිනැමේ.<br><br>⊙ ඔබේ ස්ථාවර තැන්පතුව මත පදනම්ව පුද්ගලික ණය ඉල්ලුම් කිරීමේ හැකියාව ඇත. (මුදල් ආපසු ලැබීම් ණය). ඔබේ ස්ථාවර තැන්පතුවලට අනුව පුද්ගලික ණයක් ලබා දිය හැකිය. LTV අනුපාතය සමාගම විසින් කලින් කලට තීරණය කරනු ලැබේ.<br><br>⊙ ස්ථාවර තැන්පතු ගිණුම අත්හිටුවීමේ දී ඊට ආයෝජනය කළ මුදල, පොලී ආදායම හෝ උපචිත පොලිය පාරිභෝගිකයාට අයත් ඉතිරි කිරීමේ ගිණුමකට පමණක් බැරවීම සිදුවේ. |
| ස්ථාවර තැන්පතු සේවාවේ ලක්ෂණ, නියම සහ කොන්දේසි | ⊙ තැන්පත්කරන්නා, වයස අවුරුදු 18ට වැඩි, ශ්‍රී ලාංකික පුරවැසියකු හෝ නේවාසික වීසා හිමියකු විය යුතු අතර, වලංගු ජාතික හැඳුනුම්පතක්/ගමන් බලපත්‍රයක් දරන්නකු විය යුතුය.<br>⊙ තනිව තැන්පත් කිරීම හෝ උපරිම දෙදෙනකු දක්වා බද්ධ ගිණුම් තැන්පත් කිරීම සිදු කළ හැක.<br>⊙ ව්‍යාපාර ආයතන හෝ වෙනත් ආයතනවලින් ද තැන්පතු භාරගැනේ (උදා: සංගම්, අරමුදල්, පුණ්‍ය සංවිධාන ආදිය).<br>⊙ අවම තැන්පතු මුදල වන්නේ රු. 10,000 කි.<br>⊙ තැන්පතු කාල සීමාව: මාස 1 සිට 60 දක්වා.<br>⊙ ගනුදෙනුකරුගේ තේරීම අනුව, කල් පිරීමේ දී හෝ මාසිකව පොලිය ගෙවනු ලැබේ.<br>⊙ තැන්පත්කරුට, නාමික පත්‍රිකාවේ නම් කළ හැකි උපරිම නාමිකයන් සංඛ්‍යාව තුනකි.<br>⊙ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය විසින් ප්‍රකාශ කරන ලද අවශ්‍යතා ප්‍රකාරව තැන්පත්කරුවන්/තැන්පත් සමාගම් හෝ වෙනත් ආයතන විසින් ඉල්ලා සිටින තොරතුරු යම් ගනුදෙනුකරුවකු හෙළි නොකරන්නේ නම් එම තැන්පතුව |

| | |
|---|---|
| | භාරනොගැනීමේ අයිතිය සියපත ෆිනෑන්ස් සමාගම සතු වේ .<br>⦿ ශ්‍රී ලංකා මහ බැංකුවේ උපරිම අනුපාතවලට අනුකූලව, කල් පිරීමට පෙර සිදු කරන ඉවත් කරගැනීම් සඳහා ගිවිසුම්ගත පොලී අනුපාතය නොගෙවන අතර එය ක්‍රියාත්මක කිරීමේ අයිතිය සියපත ෆිනෑන්ස් වෙත හිමි වේ.<br>⦿ තැන්පතුව වසා දැමීමේ මුදල් යොමු කෙරෙන්නේ තැන්පතු හිමියන්ගේ ගිණුමට පමණි.<br>පොලී අනුපාත සහ ගෙවීම<br>⦿ පවතින පොලී අනුපාත සඳහා කරුණාකර සියපත ෆිනෑන්ස්හි වෙබ් අඩවිය බලන්න.<br>https://www.siyapatha.lk/fixed-deposits/<br>⦿ ගනුදෙනුකරුගේ කැමැත්ත පරිදි මාසිකව හෝ කල්පිරීමේ දී පොලිය ගෙවිය හැකිය. සරල පොලී අනුපාතවල දී පොලිය උපචිත වී ස්ථාවර තැන්පතු කාල සීමාව අවසානයේ දී ගණනය කෙරෙන අතර කල්පිරීමේ දී පොලිය ගෙවනු ලැබේ. මාසිකව පොලිය ඉල්ලුම් කරන්නේ නම් සරල පොලී අනුපාතයෙන් පොලිය ගණනය කෙරෙන අතර, සෑම මසකම නියමිත දිනයේ දී පොලිය ගෙවනු ලැබේ.<br>ස්වයංක්‍රීය අලුත් වීම<br>⦿ කල්පිරීමේ දිනය හෝ ඊට පෙර තැන්පතුව අලුත් කිරීමේ හෝ ආපසු ගැනීමේ නියමයන්ට අදාළව සිදුවන යම් වෙනසක් පිළිබඳව සමාගම දැනුම්වත් නොකෙරේ නම්, මෙම තැන්පතුවට පොලිය ඇතුළත් වන අතර, එවැනිම කාල සීමාවක් සඳහා එම දිනය වනවිට පවතින පොලී අනුපාත සමඟ අලුත් කෙරේ.<br>බදු බැරකම්<br>⦿ ස්ථාවර තැන්පතු සඳහා වන පොලිය පවතින රෑඳවුම් බදු |

| | |
|---|---|
| | (WHT) නියෝගවලට යටත් වේ. සමාගම්/වෙනත් ආයතන විසින් උපයනු ලබන පොලී ආදායම ආදායම් බදු සහ රජයේ වෙනත් අයබදුවලට යටත් විය හැකිය.<br><br>තැන්පතු රක්ෂණාවරණය<br><br>• හානිපූරණය සඳහා එක් තැන්පත්කරුවකුට රු.1,100,000 ක් උපරිමය වන සේ මුදල් මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ පටිපාටිය සමඟ යෝග්‍යතාපූර්ණ තැන්පතු බැරකම් රක්ෂණය කරනු ලැබේ.<br><br>බද්ධ තැන්පතු<br><br>• ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ බද්ධ ගිණුම්වලට අදාළව, ජ්‍යෙෂ්ඨ පුරවැසි පොලී අනුපාතික ලබා ගැනීම සඳහා සියලු ගිණුම් හිමියන් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් විය යුතුය.<br>• බද්ධ ගිණුමක එක් තැන්පත්කරුවකු මියගිය අවස්ථාවක, එය සමාගමට ක්ෂණිකව දැනුම් දිය යුතු අතර, තැන්පතුවේ පොලිය ලබන්නා ලෙස සමාගම විසින් පිළිගනු ලබන්නේ ජීවත්ව සිටින තැනැත්තා පමණි.<br><br>ස්ථාවර තැන්පතු ණය<br><br>• සියපත ෆිනෑන්ස් පීඑල්සී ඉතුරුම් ගිණුම් හිමියන් වෙනුවෙන්ම හඳුන්වාදෙන ස්ථාවර තැන්පතු ණය තනි පුද්ගල, ඒකාබද්ධ හෝ ආයතනික ණය පහසුකමක් ලෙස ලබාගත හැකිය.<br>• ණය පොලී අනුපාතය = ස්ථාවර තැන්පතු අනුපාතය + ආන්තිකය<br>(කළමනාකාරිත්වයේ ඒකමතික අභිමතය පරිදි ආන්තිකය පිළිබඳ තීරණය කෙරේ)<br>• තැන්පත්කරුවාට කළමනාකාරීත්වයේ අභිමතය පරිදි තමා විසින් තැන්පත් කළ මුදල මත ණය ලබාගත හැකිය.<br>• ණය පොලී අනුපාතය හා වෙනත් ගාස්තු අයකිරීම පවතින ස්ථාවර තැන්පතු පොලී අනුපාතික මත පදනම්ව ගණනය |

| | |
|---|---|
| | කෙරේ.<br><br>⦿ ණය විසජර්නය හා ආපසු ගෙවීම සියපත ඉතිරිකිරීමේ ගිණුම් හරහා පම ර්ණ.<br><br>⦿ ණය ලබාගත හැකි සීමා:<br>කල්පිරීමේ පදනම මත විවෘත කරන ලද තැන්පතු සඳහා 80% දක්වා<br>මාසික පොලිය ගෙවීමේ පදනම මත විවෘත කරන ලද තැන්පතු සඳහා 75% දක්වා<br>සියපත ඉතිරිකිරීමේ ගිණුමකට මාසික පොලිය බැර නොකෙරෙන තැන්පතු සඳහා 60% දක්වා<br><br>⦿ අවශ්ය ලිපිලේඛන: සම්පූණර් කරන ලද ණය අයදුම්පත, ජාතික හැඳුනුම්පත, වලංගු විදේශ ගමන් බලපත්රය හෝ වලංගු රියදුරු බලපත්රය සහ ස්ථාවර තැන්පතුව පිළිබඳ සහතිකයේ මුල්පිටපත.<br><br>⦿ ලිපිනය තහවුරු කිරීම:<br>ජාතික හැඳුනුම්පත හෝ රියදුරු බලපත්රය අනුව ස්ථිර ලිපිනය වෙනස් වන්නේ නම්, කරුණාකර ලිපිනය තහවුරු කිරීමෙහිලා පහත ලේඛනවලින් එකක් ඉදිරිපත් කරන්න. ණය අයදුම්කරුගේ නමට ලැබෙන විදුලි බිල්පත්, ජල බිල්පත්, ස්ථාවර දුරකථන බිල්පත් පිටපතක්. එම බිල්පත් දිනය ණය අයදුම් දිනයට මාස 3කට නොවැඩි විය යුතු බව කරුණාවෙන් සලකන්න.<br><br>⦿ සම්පූණර් ණය ගෙවා අවසන්වන තෙක් සියපත ෆිනෑන්ස් පීඑල්සී විසින් ස්ථාවර තැන්පතු සහතිකයේ මුල් පිටපත සුරැකුමක් ලෙස රඳවා ගැනේ.<br><br>⦿ ණය ලබාගත් පළමු දිනයේ සිට හිඟ ශේෂය මත උපචිත පොලිය ගණනය කෙරේ. ණය වාරික ගෙවීම අතපසුවුවහොත් ප්රාග්ධනය මත පොලිය ගණනය කෙරේ. |

| | |
|---|---|
| | ⦿ ලිපිලේඛන සකස් කිරීමේ ගාස්තුව: අවමය රු. 1000 කි<br>⦿ සියලුම ණය පොලී අනුපාත සහ ලිපිලේඛන සකස් කිරීමේ ගාස්තු කළමනාකාරිත්වයේ අභිමතය පරිදි කලින් කලට වෙනස් විය හැකිය.<br><br>අක්‍රිය ගිණුම්<br><br>⦿ අත්හළ ස්ථාවර තැන්පතු සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබා දෙනු ලැබ ඇති සම්මත නෛතික ක්‍රියාපටිපාටිය අනුගමනය කෙරේ. වසර 10ක උපරිම කාලයක් තුළ ගනුදෙනු හෝ ලිපි හුවමාරු සිදු නොවූ තැන්පතු අක්‍රිය ලෙස සලකනු ලැබෙන අතර, ඉන්පසු 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත වාර්තා කරනු ලැබේ. |
| **ස්ථාවර තැන්පතු සේවාව ලබා ගැනීමේ ක්‍රියාපටිපාටිය** | ⦿ ස්ථාවර තැන්පතු සේවා පහසුකම්වල විස්තර ලබා ගැනීම සඳහා ගනුදෙනුකරු ශාඛාව වෙත ගොස් කාර්ය මණ්ඩල නියෝජිතයන් හමුවිය යුතුය.<br>⦿ නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත, ගනුදෙනුකරුවන් හඳුනා ගැනීමේ හවුල් යාන්ත්‍රණය (KYC) සහ අදාළ වෙනත් ලේඛන ලබා ගැනීමෙන් අනතුරුව ගිණුම විවෘත කෙරෙනු ඇත.<br>⦿ අවශ්‍ය සියලු තොරතුරු සත්‍යාපනය කිරීමෙන් අනතුරුව, අයදුම්පත අදාළ ක්‍රියාවලිය වෙත යොමු කෙරෙන අතර, ගනුදෙනුකරු වෙත ස්ථාවර තැන්පතු සහතිකයක් නිකුත් කෙරෙනු ඇත. |

## IV. ඉතිරි කිරීම

| | |
|---|---|
| **ඉතිරි කිරීම් සේවා ලාංඡන** | |
| **ඉතිරි කිරීම් සේවා පිළිබඳ විස්තරය** | ⦿ ඉතිරි කිරීමේ ගිණුම් සඳහා අවශ්‍ය විටෙක දී මුදල් ආපසු ගැනීමේ පහසුව තහවුරු කරමින්, සියපත ෆිනෑන්ස් විසින් ගනුදෙනුකාරහවතුන් වෙත සියපත කිරුළ, සියපත අභිමන්, සියපත සේවර් සහ සියපත ප්ලස් ආදී වූ විවිධ ඉතිරිකිරීමේ සේවාවන් ලබාදෙනු ලැබේ.<br>⦿ සියපත සේවර් යනු සාමාන්‍ය ඉතුරුම් ගිණුම වන අතර, සියපත ප්ලස් යනු වඩර්න ඉතුරුම් ගිණුම වේ. සියපත කිරුළ ගිණුම ළමා ඉතුරුම් සඳහා වන අතර, සියපත අභිමන් ගිණුම ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා වේ.<br>⦿ ගිණුම් ශේෂය සහ ඉතිරි කිරීමේ ගිණුමේ ස්වභාවය මත පදනම්ව, ගෙවිය හැකි පොලී අනුපාතය වෙනස් වේ. |
| **ඉතිරි කිරීම් සේවාවේ ලක්ෂණ, නියම සහ කොන්දේසි** | ⦿ තැන්පත්කරු, වයස අවුරුදු 18ට වැඩි, ශ්‍රී ලාංකික පුරවැසියකු හෝ නේවාසික වීසා හිමියකු විය යුතු අතර, වලංගු ජාතික හැඳුනුම්පතක්/ගමන් බලපත්‍රයක් දරන්නකු විය යුතුය.<br>⦿ තනිව තැන්පත් කිරීම හෝ උපරිම තිදෙනකු දක්වා බද්ධ ගිණුම් විවෘත කිරීම සිදු කළ හැක.<br>⦿ ව්‍යාපාර ආයතන හෝ වෙනත් ආයතනවලින් ද තැන්පතු භාරගැනේ (උදා: සංගම්, අරමුදල්, පුණ්‍ය සංවිධාන ආදිය).<br>⦿ අවශ්‍ය අවම ශේෂය වන්නේ රු. 1000 කි.<br>⦿ සියලු ඉතිරි කිරීමේ ගිණුම් සඳහා පොලිය ගණනය කරනු ලබන්නේ දෛනිකව වන අතර, සරල පොලී පදනමක් මත, වාෂරීකව මිල ඉදිපර්ත් කරමින් ගිණුමට මාසිකව බැර කරනු ලැබේ. උපරිම පොලී අනුපාත, ශ්‍රී ලංකා මහ බැංකුවේ උපරිම අනුපාත නොඉක්මවනු ඇත. |

| | |
|---|---|
| | - මව/පියා හෝ නීත්‍යානුකූල භාරකරු මූලික ගිණුම් හිමියා ලෙස සිටිමින්, අලුත උපන් දරුවකු හෝ වයස අවුරුදු 18ට අඩු දරුවන් සඳහා බාල වයස්කාර ගිණුම් විවෘත කළ හැකිය.<br><br>- ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය විසින් ප්‍රකාශ කරන ලද අවශ්‍යතා ප්‍රකාරව තැන්පත්කරුවකු/ සමාගම් හෝ වෙනත් ආයතන විසින් ඉල්ලනු ලබන තොරතුරු යම් ගනුදෙනුකරුවකු හෙළි නොකරන්නේ නම්, එම තැන්පතුව භාර නොගැනීමේ අයිතිය සියපත ෆිනෑන්ස් සමාගම සතු වේ. |

| | |
|---|---|
| **ඉතිරි කිරීමේ සේවාව ලබා ගැනීමේ ක්‍රියාපටිපාටිය** | ⦿ තැන්පතු පහසුකම්වල විස්තර ලබා ගැනීම සඳහා ගනුදෙනුකරු ශාඛාව වෙත ගොස් කායර් මණ්ඩලයේ සාමාජිකයින් හමුවිය යුතුය.<br>⦿ නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත, ගනුදෙනුකරුවන් හඳුනා ගැනීමේ හවුල් යාන්ත්‍රණය (KYC) සහ අදාළ වෙනත් ලේඛන ලබා ගැනීමෙන් අනතුරුව ගිණුම විවෘත කෙරෙනු ඇත.<br>⦿ අවශ්‍ය සියලු තොරතුරු සත්‍යාපනය කිරීමෙන් අනතුරුව, අයදුම්පත අදාළ ක්‍රියාවලිය වෙත යොමු කෙරෙන අතර, ගනුදෙනුකරු වෙත පාස් පොතක් (Pass Book) නිකුත් කෙරෙනු ඇත.<br><br>පොලී අනුපාත<br>⦿ පවතින පොලී අනුපාත සඳහා කරුණාකර සියපත ෆිනෑන්ස්හි වෙබ් අඩවිය බලන්න.<br>https://www.siyapatha.lk/fixed-deposits/<br><br>බදු බැරකම්<br>⦿ ඉතුරුම් තැන්පතු සඳහා වන පොලිය පවතින රඳවුම් බදු (WHT) නියෝගවලට යටත් වේ. සමාගම්/වෙනත් ආයතන විසින් උපයනු ලබන පොලී ආදායම ආදායම් බදු සහ රජයේ වෙනත් අයබදුවලට යටත් විය හැකිය.<br><br>තැන්පතු රක්ෂණාවරණය<br>⦿ හානිපූරණය සඳහා එක් තැන්පත්කරුවකුට රු.1,100,000 ක් උපරිමය වන සේ මුදල් මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ පටිපාටිය සමඟ යෝග්‍යතාපූර්ණ තැන්පතු බැරකම් රක්ෂණය කරනු ලැබේ. |

| | |
|---|---|
| | බද්ධ තැන්පතු<br><br>- ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ බද්ධ ගිණුම්වලට අදාළව, ජ්‍යෙෂ්ඨ පුරවැසි පොලී අනුපාතික ලබා ගැනීම සඳහා සියලු ගිණුම් හිමියන් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් විය යුතුය.<br>- බද්ධ ගිණුමක එක් තැන්පත්කරුවකු මියගිය අවස්ථාවක, එය සමාගමට ක්ෂණිකව දැනුම් දිය යුතු අතර, තැන්පතුවේ පොලිය ලබන්නා ලෙස සමාගම විසින් පිළිගනු ලබන්නේ ජීවත්ව සිටින තැනැත්තා පමණි.<br><br>අක්‍රීය ගිණුම්<br><br>- අත්හළ ස්ථාවර තැන්පතු සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබා දෙනු ලැබ ඇති සම්මත නෛතික ක්‍රියාපටිපාටිය අනුගමනය කෙරේ. වසර 10ක උපරිම කාලයක් තුළ ගනුදෙනු හෝ ලිපි හුවමාරු සිදු නොවූ තැන්පතු අක්‍රීය ලෙස සලකනු ලැබෙන අතර, ඉන්පසු 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත වාර්තා කරනු ලැබේ.<br><br>අනෙක් සියලු අදාළ කොන්දේසි, ඉතුරුම් ගිණුම විවෘත කිරීම සඳහා වන අයදුම්පතෙහි සඳහන් කර ඇත. |

## V. ණය සාධ්‍යකරණය

| | |
|---|---|
| **ණය සාධ්‍යකරණ සේවාවේ ලාංඡනය** | Siyapatha Finance Sfactor Unbank with us |
| **ණය සාධ්‍යකරණ සේවාව පිළිබඳ විස්තරය** | - ව්‍යාපාර ආයතනයන්ගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා ඉටුකර ගැනීමෙහිලා කෙටි කාලීන හා දිගු කාලීන පදනම යටතේ ෆැක්ටරින් පහසුකම් ලබාගත හැකිය. ඉන්වොයිසිය ෆැක්ටරින්, ණයගැතියාගේ චෙක්පත් වට්ටම්කරණය යන පහසුකම් කුඩා හා මධ්‍ය පරිමාණ ආයතන සහ සංස්ථාපිත ආයතන සඳහා ලබා ගත හැක. |

## VI. ෆාස්ට් ඩ්‍රාෆ්ට්

| | |
|---|---|
| සේවා ලාංඡනය | |
| සේවාව පිළිබඳ විස්තරය | සියපත 'ෆාස්ට් ඩ්‍රාෆ්ට්' යනු බැංකුවක අයිරාවකට සමානව පිරිනමනු ලබන පිළිවැටුම් ණයක් වන අතර, මෙහිදී ණය ගැණුම්කරු විසින් සපයනු ලබන සුරැකුම්පතේ වටිනාකම මත පදනම්ව ණය සීමාවක් තීරණය කෙරේ.<br><br>ලියාපදිංචි කළ/නොකළ මෝටර් රථ/ SUV රථ/වෑන් රථ/වාණිජමය රථවාහන/බස් රථ/ත්‍රිරෝද රථ/තනි කැබ් රථ/සැහැල්ලු ට්‍රක් රථ ආදිය ඇතුළත් පුළුල් පරාසයක රථවාහන සඳහා මෙම 'ෆාස්ට් ඩ්‍රාෆ්ට්' පහසුකම පිරිනැමේ. |

| | |
|---|---|
| සේවාවේ ලක්ෂණ, නියම සහ කොන්දේසි | මෝටර් රථයකට මාස 12 ක කාලයක් සඳහා ණය සීමාවක් ලබා දීමට අනුමත කෙරේ. උපරිම ණය සීමාව එම මෝටර් රථයේ විකුණුම්/බැහැර කිරීම් වටිනාකම (YDV) මත රඳා පවතී.<br><br>ණයගැනුම්කරුවන් මාස 12 ක කාලයක් තුළ මාසික පොලිය ගෙවිය යුතු අතර, හැකි නම්, ණයට ගත් මුදලෙන් යම් ප්‍රමාණයක් ආවරණය වන පරිදි ගෙවීම් කළ හැකි ය. මාස 12 ක කාලය අවසන් වූ විට, පවතින ණය අගය හෝ ඉහළ අගයක් යටතේ ණය පහසුකම අලුත් කිරීමට හෝ ඉතිරි ශේෂය එකවර ගෙවීමේ හැකියාව ණයගැනුම්කරුවන්ට සැලසේ.<br><br>අනුමත ණය පහසුකමට අදාළ සීමාව 11 වන මාසයේ දී සමාලෝචනය කෙරෙන අතර, පහසුකමේ වටිනාකම වැඩි කිරීම, අඩු කිරීම, අඛණ්ඩව ලබා දීම හෝ අවසන් කිරීම සම්බන්ධයෙන් තීරණ ගැනීමේ අයිතිය සමාගම සතු ය.<br><br>අනුමත ණය සීමාව තුළ අධර් වශයෙන් ණය මුදල් ගෙවන ලෙස ඉල්ලීමේ හැකියාව ණයගැනුම්කරුවන්ට පවතින අතර, එවැනි සෑම ඉල්ලීමක්ම වෙනම ගනුදෙනුවක් ලෙස සැලකේ. ණය පහසුකමෙහි අවසන් දිනයට ළඟා වූ විට, සමාගමේ තක්සේරුකරු මෝටර් රථයේ වත්මන් වෙළඳපොළ වටිනාකම සහ ඉතිරි ණය ශේෂය පරීක්ෂා කරනු ඇත. එම ශේෂය සමඟ ණය පහසුකම අලුත් කරනවාද, නැතිනම් ප්‍රාග්ධනය ආපසු ගෙවිය යුතුද, යන්න ඔහු විසින් තීරණය කරනු ලැබේ.<br><br>**ණය සීමාව**<br><br>- රථ වාහනයක් සඳහා වන අවම ණය පහසුකම රු. 500,000 කි<br><br>- රථ වාහනයක් සඳහා වන උපරිම ණය පහසුකම රු. 10,000,000 කි<br><br>- රථවාහන සමූහයක් සඳහා වන උපරිම ණය පහසුකම රු. 25,000,000 කි<br><br>**ණය කාල සීමාව**<br><br>- ණය සීමාව මාස 12ක කාලයක් දක්වා වලංගු වේ.<br><br>පහසුකම පිළිබඳව සලකා බලනු ලැබීමට පෙරාතුව, සේවාදායකයා වෙත, පවතින අදාළ පොලී ගාස්තු දැනුම් දෙනු ලැබේ.<br><br>ණය පහසුකම්වලට අදාළ වන පොලී අනුපාතය, පහසුකම් වගර්ය, භුක්ති විඳින කාල සීමාව සහ පිරිනමනු ලබන සුරැකුම ආදිය මත රඳා පවතියි. වෙළඳපොළ තත්ත්වයන් මත පදනම්ව, පොලී අනුපාත කලින් කලට ප්‍රතිශෝධනය කරනු ලැබේ.<br><br>** නියමිත වේලාවට ගෙවීම් සිදු නොකළහොත්, සමාගම එහි නීති රීතිවලට අනුව, ගෙවිය යුතු පොලිය/මුදල සඳහා වන අමතර පොලී අය කරනු ඇත.<br><br>**සපුරාළිය යුතු සුදුසුකම්:**<br><br>ශ්‍රී ලංකාවේ පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියෙක් විය යුතු ය.<br><br>වයස අවුරුදු 65 ට අඩු විය යුතු ය.(මෙම සීමාව ඉක්ම වන්නේ නම්, ඒ සඳහා |

| | |
|---|---|
| | අනුමැතිය ලබා ගත යුතු ය)<br><br>වසර 01 ක මෙහෙයුම් කාලයක් සම්පූර්ණ කර ඇති ව්‍යාපාරික අංශ (සුළු හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසාය)<br><br>රථ වාහන වෙළෙන්දන් / අලෙවිකරුවන්<br><br>පොලී අනුපාත, අය කිරීම්, පහසුකමේ වටිනාකම, පියවීමේ කාල සීමාව, ඇප අවශ්‍යතා සහ වෙනත් විශේෂ නියම සහ කොන්දේසි, පහසුකම් ස්වභාවය මත පදනම්ව එකිනෙකට වෙනස් විය හැකි ය. ගිවිසුමට එළඹීමට පෙර, ණය ගැනුම්කරුට ඉදිරිපත් කරන ‘අපර්ණ ලිපිය’ මගින්, සියලු නියම සහ කොන්දේසි පිළිබඳව දැනුම්වත් කරනු ලැබේ. |

| | |
|---|---|
| සේවාව ලබා ගැනීමේ ක්‍රියාපටිපාටිය | ප්‍රථමයෙන්ම, සේවාවෙහි ලක්ෂණ සහ අවශ්‍යතා පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා ණයගැනුම්කරු සමාගමේ නියෝජිතයකු හමුවිය යුතු ය.<br><br>සාකච්ඡාවෙන් අනතුරුව, ණයගැනුම්කරු සහ සමාගම් නියෝජිතයා විසින් සේවාවට අදාළ නියම සහ කොන්දේසි කතිකා කරගනු ලැබේ. ණයගැනුම්කරු, අදාළ අයදුම්පත්‍රය නිසි ලෙස පුරවා අවශ්‍ය ලිපිලේඛන ද සමඟ සමාගම් නියෝජිතයාට එය භාර දිය යුතු ය.<br><br>සම්පූර්ණ අයදුම්පත ලද විට, සමාගම විසින් එය අදාළ ක්‍රියාවලිය වෙත යොමු කර තක්සේරු කරනු ලැබේ.<br><br>අනුමැතිය ලබා දෙන ක්‍රියාවලියේ දී, වැඩිදුර තොරතුරු, ලේඛන හෝ ණය විශ්ලේෂණය මත පදනම් වූ තොරතුරු ලබා ගැනීම සඳහා ගනුදෙනුකරු/ ඇපකරුවන්ව සම්බන්ධ කරගනු ලැබේ<br><br>මුල් අවස්ථාවේ දී කතිකා කරගත් නියම සහ කොන්දේසි, අනුමැතිය ලබා දෙන අවස්ථාවේ දී සංශෝධනයට ලක් විය හැකි අතර, පහසුකම ප්‍රදානය කිරීමට පෙරාතුව ඒ පිළිබඳව සමාගම විසින් අයදුම්කරුව දැනුම්වත් කරනු ලැබේ.<br><br>සමාගම විසින් පහසුකම අනුමත කරනු ලබන අවස්ථාවේ දී, අවශ්‍ය නෛතික ලේඛන සම්පාදනය කරනු ලැබෙන අතර, ලේඛන නිසි ලෙස සම්පූර්ණ කරනු ලැබීමෙන් අනතුරුව පහසුකම සැපයීම සිදු කෙරේ.<br><br>පහසුකමක් සඳහා අනුමැතිය ලබා දීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ පරම අභිමතය සමාගම සතු වේ. |

**අදාළ පොලී අනුපාත**

| **පහසුකම/සේවාව** | **පොලී අනුපාතය** | **පමා වී ගෙවීමේ ගාස්තු** |
|---|---|---|
| ලීසිං | 14% - 38% වා.පො | 4% මා.පො |
| ණය | 15% - 20% වා.පො | 2% මා.පො |
| ණය සාධ්‍යකරණය | 15% -18% වා.පො | ණය පොලී ප්‍රතිශත + 0.83% මා.පො |
| රන් මූල්‍යකරණය | 16.% - 22% වා.පො | 0.5% මා.පො |
| ෆාස්ට් ඩ්‍රාෆ්ට් | 13.5% - 18% වා.පො | 4% මා.පො |
| කාලීන තැන්පතු සහ ඉතිරි කිරීම් | තැන්පතු පහසුකම් සඳහා වන අදාළ පොලී අනුපාත ශාඛාවන්හි සහ www.siyapatha.lk වෙබ් අඩවියේ ප්‍රදශර්නය කර ඇත. | |
| ස්ථාවර තැන්පතු එරෙහිව ණය | වත්මන් FD අනුපාතය + 6% | |

- ණය පහසුකම්වලට අදාළ පොලී අනුපාතය පහසුකම් වගර්ය, භුක්ති විඳින කාල සීමාව සහ පිරිනමනු ලබන සුරැකුම ආදිය මත රඳා පවතියි. වෙළෙඳපොළ තත්ත්වයන් මත පදනම්ව, පොලී අනුපාත කලින් කලට ප්‍රතිශෝධනය කරනු ලැබේ.

## 02. වෙනත් අය කිරීම්, ගාස්තු සහ කොමිස්

- සැකසුම් ගාස්තු සහ රක්ෂණ වාරික ගාස්තු, රජයේ අදාළ බදු (අදාළ නම්), තක්සේරු ගාස්තු ආදිය ණයගැනුම්කරු විසින් දරනු ලැබිය යුතු අතර, ණය පහසුකම් පිළිබඳව කතිකා කරගන්නා අවස්ථාවේ දී ඒ පිළිබඳව නිශ්චිතව දැක්වීම සහ තොරතුරු සන්නිවේදනය කිරීම සමාගම විසින් සිදු කරනු ලැබේ. සියලු ගාස්තු සහ අය කිරීම්, අදාළ පිරිනැමීමේ ලිපියේ නිශ්චිතව දක්වා ඇත.
- පහසුකම ලබා දෙන කාලය තුළ එකතු කර ගත යුතු පහසුකමේ කොටසක් ලෙස සමාගම විසින් පිරිනමනු ලබන යම් වධර්ක ප්‍රතිලාභ හෝ ඇතැම් පිරිවැය සමාගම විසින් ආපසු ගෙවනු ලැබිය හැක. පාරිභෝගිකයා විසින් එකඟ වන ලද අවසාන කුලිය/වාරිකය එවැනි ආපසු ගෙවීමේ වධර්ක ප්‍රතිලාභ හෝ පිරිවැයවලට ඇතුළත් වේ.

- තැන්පතු හිමියකු ණය පහසුකම් ඉල්ලා සිටින විට, එවැනි ණය පහසුකම් සඳහා අදාළ වන තැන්පතුවල, පොලී අනුපාතවල සහ අය කිරීම්වල ඇප වීම්, අනුමත කරනු ලබන කාලය තුළ දී දැනුම්වත් කරනු ලැබේ.

### 03. අදාළ නෛතික විධිවිධාන

- 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත, 1949 අංක 6 දරන උකස් පනත, සිවිල් නඩු විධාන සංග්‍රහය සහ ශ්‍රී ලංකාවේ පවතින අදාළ අනෙක් නීති ප්‍රකාරව පහසුකම් සේවා කටයුතු සිදු කරනු ලැබේ.

### 04. රහස්‍යභාවය

- 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 61 වන වගන්තියේ විධිවිධාන යටතේ පාරිභෝගිකයාගේ සියලු ගනුදෙනුවලට අදාළ පූර්ණ රහස්‍යභාවය සමාගම විසින් සුරකිනු ලැබේ.

### 05. 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාතර්ා කිරීමේ පනත

- සමාගමට, යම් ගනුදෙනුවක් හෝ ගනුදෙනු කිරීමට තැත් කිරීමක්, යම් නීතිවිරෝධී කටයුත්තක් හෝ වෙනත් යම් සාපරාධී වරදක් කිරීමට අදාළ විය හැකි යැයි සැක කිරීමට තරම් හේතු ඇති අවස්ථාවක දී, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාතර්ා කිරීමේ පනතේ 7 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සමාගම විසින් මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාතර්ා කරනු ලැබිය යුතුය.

### 06. පැමිණිලි භාරගැනීමේ ක්‍රියාවලිය

- සියපත ෆිනෑන්ස් පීඑල්සී සේවාවක් සම්බන්ධයෙන් ඔබේ යම් පැමිණිල්ලක් වේ නම් දීපව්‍යාප්ත අපගේ ශාඛා කායර්ාලයකට පිවිසීමෙන්, අප වෙත දුරකතන ඇමතුම් මාගර්යෙන්, ලිපියක් මාගර්යෙන්• •ර්මේල් පණිවුඩයක් හරහා, මැසේජ් සේවාවක් හරහා හෝ අපගේ වෙබ් අඩවියේ පැමිණිලි භාරගන්නා සේවාව ඔස්සේ අප වෙත යොමුකරන්න.
- ඔබේ පැමිණිල්ල අප වෙත ලැබීමෙන් පසු විශේෂ යොමු අංකයක් ඇතුලත්කොට පැමිණිල්ල විමෂර්ණය කිරීමෙහිලා පාරිභෝගික සබඳතා අංශයේ නිලධාරියෙකු පත් කෙරේ. සතියේ වැඩකරන එක් දිනක් ඇතුලත ඔබගේ පැමිණිල්ල භාරගත් බවට තහවුරු කෙරෙනු ඇත.
- ඔබගේ පැමිණිල්ල වැඩකරන දින •••ක් ඇතුළත විසඳීමෙහිලා අපි හැකි සෑම උත්සාහයක්ම ගන්නෙමු. යම්හෙයකින් විමෂර්ණ ක්‍රියාවලියට දින •••කට වැඩි කාලයක් ගතවන්නේ නම්• •දින •••අවසන් වන්නට පෙර ඒ පිළිබඳ ඔබ දැනුවත් කෙරේ. පැමිණිලි විසඳීමෙහිලා ගතවන උපරිම කාලය පැමිණිල්ල ලැබුණ දිනයේ සිට මාස •ක් වේ.
- අපගේ විමෂර්ණ ක්‍රියාවලියේ අවසන් ප්‍රතිචාරය සම්බන්ධයෙන් ඔබ තෘප්තිමත් නොවන්නේ නම් ඔබගේ පැමිණිල්ලට විසඳුමක් ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාතර්මේන්තුවේ මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයා හා සම්බන්ධවීමට ඔබට හැකියාව ඇත.

**සම්බන්ධ කර ගැනීම සඳහා**

| | තොරතුරු සඳහා සම්බන්ධවන්න | සියපත ෆිනෑන්ස් පීඑල්සී | ශ්‍රී ලංකා මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයා | ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාතර්මේන්තුව |
|---|---|---|---|---|
| 1. | තැපැල් ලිපිනය | කළමනාකරු, පාරිභෝගික සබඳතා දෙපාතර්මේන්තුව, සියපත ෆිනෑන්ස් පීඑල්සී, •••; ඩඩ්ලි සේනානායක මාවත, කොළඹ ••: | ශ්‍රී ලංකා මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයා, අංක •••/ඒ, වජිර පාර, කොළඹ ••: | මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාතර්මේන්තුව, අංක ••; ජනාධිපති මාවත, කොළඹ ••: |
| 2. | දුරකතන අංකය | 0117 581333 | 0112 595624 | 0112 477966 |
| 3. | ෆැක්ස් | | 0112 595625 | 0112 477744 |
| 4. | විද්‍යුත් තැපැල් ලිපිනය | customerrelations@siyapatha.lk | fosril@sltnet.lk | fcrd@cbsl.lk |
| 5 | වෙබ් පෝරම සබැඳිය | https://www.siyapatha.lk/si/contact-us/ | http://financialombudsman.lk/forms.php | https://www.cbsl.gov.lk/si/fcrd |

*පහසුකම්වල ලක්ෂණ අවබෝධ කර ගැනීමට ඔබට සහාය වීම සඳහා, සියපත ෆිනෑන්ස් පීඑල්සී විසින් පිරිනැමෙන පහසුකම් සහ සේවාවල ප්‍රධාන ලක්ෂණ පිළිබඳව ප්‍රධාන තොරතුරු ලේඛනයේ අන්තගර්ත වේ. ඕනෑම අවස්ථාවක දී, සමාගමේ පරම අභිමතය අනුව, ඉහත කී යම් නියම, කොන්දේසි, සහ අය කිරීම් සංශෝධනය කිරීමේ අයිතිය සමාගම සතු ය.*

## 07. ප්‍රවේශවීමේ හැකියාව සැකසීම

අදාළ නීති සහ මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසි වලට අනුකූලව, සිය හඳුනාගත් ගනුදෙනුවලට අදාළ ලේඛන සහ තොරතුරු ලබා ගැනීමට සහ ප්‍රවේශ වීමට ගනුදෙනුකරුවන්ට අයිතියක් ඇත. එවැනි ප්‍රවේශය ව්‍යවස්ථාපිත, නියාමන, රහස්‍යභාවය, දත්ත ආරක්ෂණ හෝ ආරක්ෂක අවශ්‍යතාවලට යටත් විය හැකිය.